# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/22 - 2021 අගෝස්තු මස 03 වැනි අඟහරුවාදා - 2021.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරිය ) 184. (1) (i) සහ 184 (1ආ) (ආ) උපවගන්ති යටතේ කරනු ලබන නියමය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184. (1අ) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් ආණ්ඩුකාරවර වන මා විසින් ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති වවුලන්බොක්ක ගමගේ ලලිත් ධර්ම කීර්ති මහතා විසින් 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184.(1) වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් කිසිවක් සිදුකර ඇත්තේ ද යන්න පිළිබඳව මාස තුනක (03) කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා අංක 2210/50 හා 2021.01.15 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් පත් කරන ලද ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභා විසින් පරීක්ෂණයක් සිදුකර පැමිණිල්ලේ සාක්ෂි සහ ලේඛන සලකා බැලීමෙන් අනතුරුව සිය නිරීක්ෂණ හා නිගමන සහිතව මා වෙත භාරදී ඇති 2021.07.06 දිනැති අවසන් වාර්තාව ප්‍රකාරව ;

වවුලන්බොක්ක ගමගේ ලලිත් ධර්ම කීර්ති මහතා, ඇඹිලිපිටිය නගර සභාවේ සභාපතිවරයා වශයෙන් එකී ධූරයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184. (1) (ඇ), 184. (1) (ඈ) සහ (ඉ) උපවගන්තිවල සඳහන් වැරදි සිදුකර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට මා සෑහීමකට පත් වූ හෙයින් ;

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184. (1) (i) සහ 184. (1ආ) (ආ) උපවගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව වන මම ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති වවුලන්බොක්ක ගමගේ ලලිත් ධර්ම කීර්ති මහතා 2021.08.03 වැනි දින සිට ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති ධූරයෙන් පහ කරමි.

**ටිකිරි කොබ්බෑකඩුව,**
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර.

2021 අගෝස්තු මස 03 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

08 - 190

1A - PG 5517 — 25 (2021/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*